කරෙයිනගර් ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය.

------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

--------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.

----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 11 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 10 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කර ඇත.

1.2 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව කරෙයිනගර් ප්‍රාදේශිය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කරෙයිනගර් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

(අ) වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි බලපෑම | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| අඩුවෙන් දැක්වීම් | 01 | 15,725,673 | - | - |
| වැඩියෙන් දැක්වීම් | 01 | 397,966 | 01 | 78,510 |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.14,236,343 ක් වූ ගනුදෙනු 05 ක් විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු.566,913 ක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු.16,010,971 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කර නොතිබූ අතර ඒ හේතුවෙන් විගණනයේදි තථ්‍ය ආදායම් සහ අයවැයගත ආදායම් අතර රු.3,167,756 ක වෙනසක් ද, අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු.2,414,598 ක වෙනසක් ද නිරීක්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 41 | 43 | - |
| බදු කුලී | 312 | 242 | - |
| බලපත්‍ර ගාස්තු | 208 | 160 | - |
| වෙනත් ආදායම් | 16,651 | 13,599 | 2,806 |
| | 17,212 | 14,044 | 2,806 |

### 2.3.2 ආදායම් අහිමිවීම

සභා බල ප්‍රදේශය තුල තක්සේරු බදු ඇස්තමේන්තු කර අයකරගෙන නොතිබුණි. එබැවින් සභාවට සැලකිය යුතු ආදායම් ප්‍රමාණයක් අහිමිවී තිබුණි.

### 2.3.3 උසාවි දඩ

2011 ජුලි සිට දෙසැම්බර් දක්වා සහ 2012 වර්ෂය සඳහා කාලපරිච්ඡේද තුල විවිධ ආඥා පණත් යටතේ පනවන ලද පිළිවෙලින් රු.204,833 ක් සහ රු.796,500 ක් වූ උසාවි දඩ සහ දණ්ඩන අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

2.3.4 මුද්දර ගාස්තු

-----------------

(අ) 2012 ජනවාරි සිට ජුනි දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.1,801,605 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 ජුලි සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා වූ මුද්දර ගාස්තු උපලේඛනය ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

--------------------------------

2.4.1 ලැබිය යුතු ගිණුම්

---------------------

පුරනැඟුම ප්‍රාග්ධන ප්‍රදාන පුතිපූර්ණය සඳහා සහ අරමුදලෙන් ගෙවන ලද රු.10,000,000 ක් වූ අත්තිකාරම මෙම වාර්තාවේ දින දක්වා නිරවුල් කර නොතිබුණි.

2.4.2 අචල ජංගම වත්කම්

---------------------------

2009 වර්ෂයේදි කරන ලද රු.1,500 ක් වූ විදුලිබල තැන්පතුවක් මෙම වාර්තාවේ දින දක්වාම චලනය නොවන ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි.

2.4.3 සමීක්ෂණය නොකළ වත්කම්

------------------------------------

වත්කම් 2012 දෙසැම්බර් 31 දිනට වූ සමීක්ෂණ මණ්ඩල වාර්තාවක් මගින් සනාථ නොකොට පොත් අගය මත රු.24,170,178 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| ස්ථාවර වත්කම් | 21,364,251 |
| ගබඩා විෂයයන් | 2,805,927 |
| | 24,170,178 |

2.4.4 වාහන උපයෝජනය

---------------------------

සභාව විසින් භාවිතා කරන ලද වාහන 08 ක් සඳහා ආදායම් බලපත්‍ර සහ රක්ෂණ ආවරණ ලබගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | සංඛ්‍යාව |
| --- | --- |
| රෝද 4 ට්‍රැක්ටර | 02 |
| රෝද 4 ට්‍රැක්ටර් ටේලරය | 01 |
| රෝද 2 ට්‍රැක්ටර් | 01 |
| රෝද 2 ට්‍රැක්ටර් ටේලරය | 01 |
| රෝද 4 ට්‍රැක්ටර් ඩෝසර | 03 |
| | 08 |

2.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

------------------------------------------------------

විගණනයේදි පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව. | | අනුකූල නොවීම් |
| --- | --- | --- |
| (අ) ප්‍රාදේශිය සභා ( මූල්‍ය සහ පරිපාලන) රීති - 1988 | | |
| (i) II පරිච්ඡේදයේ 4 වගන්තිය | - | තක්සේරු බදු සහ සභාව විසින් අයකර නොතිබුණු බදු වලට අදාළව තක්සේරු ලේඛනයක් සභාව විසින් පවත්වා නොතිබුණී. |

| | | | |
|---|---|---|---|
| (ii) | III පරිච්ඡේදයේ 81 වගන්තිය | - | සෑම කාර්තුවකදීම මුද්දර බදු නිරවුල් කිරිමට සහ දණ්ඩන ආපසු ගෙවිම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (iii) | V පරිච්ඡේදයේ 140 වගන්තිය | - | නියමිත දිනයේදි රු.10,530,000 ක් වු අත්තිකාරම් නිරවුල් කිරිම සම්බන්ධයෙන් ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය - X පරිච්ඡේදයේ 7.2 වගන්තිය | - | පැය 80 ට වැඩි අතිකාල ගෙවීම් රු.89,465 සඳහා අමාත්‍යවරයාගේ හෝ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | අංක 12/2000 සහ 2012 ජනවාරි 20 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | ප්‍රවර්තන වර්ෂය සඳහා කාර්මික විද්‍යාල අභ්‍යාසලාභීන්ගේ පුහුණු දීමනා රු.90,400 ක් අඩුවෙන් ගෙවා තිබුණි. |

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ ප්‍රජා මධ්‍යස්ථානය ඉදිකිරිම සඳහා ගෙවිය යුතු මුදල් වෙනුවෙන් විවිධ ණය හිමියන් යටතේ ප්‍රතිපාදනය කළ රු.82,494 ක මුදල වර්ෂ 05 කට අධික කාලයක් තිස්සේ ගෙවා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල සිදුකළ ප්‍රාග්ධන වැඩ සඳහා විවිධ ණයහිමියන් යටතේ රු.5,288,478 ක් ප්‍රතිපාදනය කර තිබුණු නමුත් මෙම වාර්තාවේ දින දක්වා එය ගෙවා නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| වැඩ විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| පොදු නළ ලිඳක් ඉදිකිරිම | 952,000 |
| මරුතපුරම් කෝවිල ප්‍රතිසංස්කරණය කිරිම - පුරනැගුම | 4,336,478 |
| | 5,288,478 |

(ඇ) රු.149,839 ක් වූ පරිසර බදු සහ රඳවුම් මුදල් අදාළ පාර්ශවයන්ට නොගෙවා මෙම වාර්තාවේ දින දක්වා තැන්පතු ගිණුමෙහි තබාගෙන තිබුණි.

2.7 අත්හැර දැමූ ව්‍යපෘති

ව්‍යපෘති 07 ක් ක්‍රියාත්මක කිරිම සඳහා රු.84,340,000 ක මුදලක් වෙන් කර තිබුණු නමුත් එම ව්‍යපෘති සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

විස්තර පහත දැක්වේ.

| ව්‍යපෘති පිළිබඳ විස්තර | අරමුදල් සම්පාදන නියෝජිතායතන | අයවැයගත මුදල |
|---|---|---|
| තොප්පුකාඩු-වයිරාවර් කෝවිල මාර්ගය පුනරුත්ථාපනය | NELSIP | 20,000,000 |
| වීම්පාඩි මාර්ගය පුනරුත්ථාපනය | NELSIP | 15,000,000 |
| කැසුවරිනාස් බීච් සංචාරක ස්ථානය පුනරුත්ථාපනය | NELSIP | 6,340,000 |
| ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල පුනරුත්ථාපනය | CBG | 10,000,000 |
| සාප්පු සංකීර්ණය | CBG | 10,000,000 |
| මනාර්කාඩු කෝවිල මාර්ගය පුනරුත්ථාපනය | PSDG | 18,000,000 |
| වීරකුලම් අලඩි මාර්ගය පුනරුත්ථාපනය | PSDG | 5,000,000 |
| | | 84,340,000 |

2.8 අභ්‍යන්තර විගණනය

--------------------------

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති සහ පාලන

-----------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ආදායම් රැස්කිරීම්

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ගිණුම්කරණය

(ඈ) වාහන උපයෝජනය

(ඉ) අයවැය පාලනය